# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 13,344 — 1962 ඔක්තෝබර් 12 වැනි සිකුරාද — 1962.10.12

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


## I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය.

(වෙන වෙන ම ගොනු කර ගත හැකි පරිදි, සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොද ඇත.)


| | පිට |
|---|---|
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන ප්‍රකාශන ආදිය ... ... | — |
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් ආදිය ... | 1425 |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය ... | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය ... | 1425 |
| වෙනත් පත් කිරීම් ආදිය ... ... ... | 1426 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත් කිරීම් ආදිය ... ... | — |
| ආණ්ඩුවේ නිවේදන ... ... ... | 1427 |
| මිළ පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහා බැංකුවේ දැන්වීම් ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... | — |
| ආණ්ඩුවේ වත් කම් හා බැරකම් ප්‍රකාශ ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... | 1428 |
| "සුරාබදු ආඥාපනත" පිළිබඳ දැන්වීම් ... ... | — |


## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත්කිරීම් ආදිය

**1962 අංක 419**

අංකය : ඩී/වීඑෆ්/18 ඒ.

**රාජකීය ලංකා ස්වේච්ඡා නාවික හමුදාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීම්**

පහත සඳහන් නිලධාරියා 1960 ජූලි මස 1 වැනි දින සිට උප ලයිතන් පදවියෙහි ස්ථිර කොට ඇත:—

වැඩබලන උප ලයිතන් වී. පී. පීරිස්, රා. ලං. ස්වේ. නා. හ.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ඇන්. කථු. දියෙස්.
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1962 ඔක්තෝබර් 3 වෙනිදා,
කොළඹ දීය.

10-463

---

**1962 අංක 420**

අංකය : ඩී.82/ශුකේ පී.

**රාජකීය ලංකා ගුවන් හමුදාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීම්**

1962 ඔක්තෝබර් 1 වැනි දින සිට තාවකාලික වින්ග් කොමාන්ඩර් වරු වශයෙන් :—

ස්කොඩ්රන් ලීඩර් පත්මන් හරිස් ප්‍රසාද මෙන්ඩිස්—01029—පොදුකාර්‍යය/නියමු.

ස්කොඩ්රන් ලීඩර් පොන්නු කණගසබි ත්‍යාගරාජා—01012—කාර්මික/ඉංජිනේරු.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ඇන්. කථු. දියෙස්.
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1962 ඔක්තෝබර් 5 වෙනිදා,
කොළඹ දීය.

10-464

## අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත්කිරීම් ආදිය

**1962 අංක 421**

අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් පහත සඳහන් පත් කිරීම් කර ඇත්තේ ය:—

අංකය : ජේඒ. 12/48.

එම්. ඒ. එම්. හුසේන් මහතා 1962 ඔක්තෝබර් මස 6 වැනි දින සිට ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් අංක 84/60 දරණ හබයස් කෝර්පස් පෙත්සම අසා අවසාන වන තෙක් හෝ තීන්දුව දීමට කොළඹ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට සහ කොළඹ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑස්සී/පීපී. 9/62.

මොහමඩ් හුසේන් මහතා 1962 ඔක්තෝබර් මස 1 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු කළුතර මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වෙස්ට් කොමසාරිස් ධුරයට සහ කළුතර අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑම්. 2/56 (III).

සී. ඊ. මැන්දිස් මහතා 1962 ඔක්තෝබර් මස 1 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු ලංකා අධිකරණ සේවයේ නිලධාරියෙකු වශයෙන් වැඩ බැලීමට සහ අතිරික්ත නිලධාරියකු වශයෙන් සහ (කුලියාපිටියේ පළාත් ආණ්ඩු සභාව පිහිටි සීමාව තුළ) කනදුල්ලේ පිහිටි උසාවියේ කුරුණෑගල අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට සහ රික්වෙස්ට් කොමසාරිස් ධුරයට සහ (කුලියාපිටියේ පළාත් ආණ්ඩු සභාව පිහිටි සීමාව තුළ) කනදුල්ලේ පිහිටි උසාවියේ කුරුණෑගල අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 16. ඒ/59.

සී. ඊ. ධම්සේකර මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු ආර්. පී. ද සිල්වා මහතා 1962 සැප්තැම්බර් මස 28 වැනි දින සිට බලපිටියේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට සහ අතිරේක කොමසාරිස් ධුරයට සහ බලපිටියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 67/48.

එස්. තම්බිදුරෙයි මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු ජේ. ජේ. ඩේවිඩ් මහතා 1962 ඔක්තෝබර් මස 9 වැනි දින

1425—බී 45737—4,936 (62/10)

සිට 14 වැනි දින දක්වා මඩකලපුවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට සහ අතිරේක මහේස්ත්‍රාත් ධුරයට සහ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේඑල්. 3.බී/60.

එස්. අමරසිංහ මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු ජේ. එන්. සී. තිරුචෙල්වම් මහතා 1962 ඔක්තෝබර් මස 1 වැනි සහ 2 වැනි දිනයන්හි කොළඹ අතිරේක මහේස්ත්‍රාත් ධුරයට සහ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් ධුරයට සහ කොළඹ අතිරේක නාගරික මහේස්ත්‍රාත් ධුරයට සහ කොළඹ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 68. සී/51.

සී. වී. උදලාගම මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු එස්. කන්දසියා මහතා 1962 සැප්තැම්බර් මස 30 වැනි දින අනුරාධපුරයේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, අනුරාධපුරේ අතිරේක මහේස්ත්‍රාත් ධුරයට සහ රික්වෙස්ට් කොමසාරිස් ධුරයට, මන්නාරම සහ වවුනියාවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, වවුනියාවේ අතිරේක මහේස්ත්‍රාත් ධුරයට, ත්‍රිකුණාමලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට සහ ත්‍රිකුණාමලේ අතිරේක මහේස්ත්‍රාත් ධුරයට.

අංකය : ජේඑල්. 14. සී/53.

එම්. එම්. අබ්දුල් කාදර් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු ඒ. සී. කනගසිංහම් මහතා 1962 ඔක්තෝබර් මස 7 වැනි දින සිට 10 වැනි දින දක්වා ත්‍රිකුණාමලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, ත්‍රිකුණාමලේ අතිරේක මහේස්ත්‍රාත් ධුරයට සහ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් ධුරයට, අනුරාධපුරේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට සහ අනුරාධපුරේ අතිරේක මහේස්ත්‍රාත් ධුරයට.

අංකය : ජේඑල්. 51. ඒ/54.

ටී. ජේ. රාජරත්නම් මහතා නැවත වැඩ බාරගන්නාතුරු හෝ නැවත නියමයක් කරනතුරු සී. එච්. උදලාගම මහතා 1962 සැප්තැම්බර් මස 28 වැනි දින සිට කෑගල්ලේ අතිරේක මහේස්ත්‍රාත් සහ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් ධුරයට සහ කෑගල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 8.බී/57.

බී. ටී. ද සිල්වා මහතා නැවත වැඩ බාරගන්නා තුරු හෝ නැවත නියමයක් කරන තුරු පී. එන්. බතෝලමියුස් මහතා 1962 ඔක්තෝබර් මස 2 වැනි දින සිට නුවරඑළියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, නුවරඑළියේ අතිරේක මහේස්ත්‍රාත් ධුරයට සහ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් ධුරයට, නුවරඑළියේ අතිරේක නාගරික මහේස්ත්‍රාත් ධුරයට සහ බදුල්ල-හල්දුම්මුල්ල අතිරේක මහේස්ත්‍රාත් ධුරයට.

අංකය : ජේඑල්. 37.ඒ/55.

පී. මාරපන මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු සී. එච්. උදලාගම මහතා 1962 ඔක්තෝබර් මස 5 වැනි දින සිට 8 වැනි දින දක්වා කෑගල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, කෑගල්ලේ අතිරේක මහේස්ත්‍රාත් ධුරයට සහ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේඑල්. 6/48.

ඒ. ටී. ආර්. කොරෙයා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු පී. ජී. ද සිල්වා මහතා 1962 ඔක්තෝබර් මස 8 වැනි දින සිට අවිස්සාවේල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, අවිස්සාවේල්ලේ අතිරේක මහේස්ත්‍රාත් ධුරයට සහ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් ධුරයට.

අංකය පීඑල්/එච්. 1/48.

ඒ. එස්. එච්. හෙරත් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු එච්. හෙරත් මහතා 1962 ඔක්තෝබර් මස 3 වැනි දින හලාවත දිස්ත්‍රික්කයේ උතුරු සහ දකුණු පිටිගල් කෝරළයන්හි ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/ඩබ්ලිව්. 10/53.

ඊ. බී. වැත්තෑව මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු ඒ.ඩබ්ලිව්. ඒ. ඉමැනුවෙල් මහතා 1962 ඔක්තෝබර් මස 2 වෙනි, 5 වෙනි, 10 වෙනි සහ 11 වෙනි දිනයන්හි කුරුණෑගල දිස්ත්‍රික්කයේ දේවමැදි හත්පත්තුවේ ගම්බද උසාවි සභාපති වශයෙන් හා වන්නි හත්පත්තුවේ, කටුගම්පොල හත්පත්තුවේ සහ හිරියාල හත්පත්තුවේ අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/ඩී. 6/52.

ඩී. ද සිල්වා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු එච්. ඩබ්ලිව්. ජේ. මුතුකුමාරු මහතා 1962 සැප්තැම්බර් මස 29 වැනි දින පුත්තලම් දිස්ත්‍රික්කයේ පුත්තලම් පත්තු, දෙමළ හත්පත්තු සහ කල්පිටියේ ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/එම්.7/56.

එන්. වී. පී. මෙන්ඩිස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු ඒ. එෆ්. එච්. ද අල්විස් මහතා 1962 ඔක්තෝබර් මස 1 වැනි දින සිට 3 වෙනි දින දක්වා ගාලු සහ බලපිටිය දිස්ත්‍රික්ක වල ගඟබොඩ සහ ගිනිදුම් පත්තුවල ගම්බද උසාවි සභාපති වශයෙන් හා වැල්ලබොඩ පත්තුවේ අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/අයි.3/48.

ඩබ්ලිව්. බී. ඉඹුල්දෙණිය මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු ආර්. පළිහුව මහතා 1962 සැප්තැම්බර් මස 27 වෙනි දින මහනුවර දිස්ත්‍රික්කයේ උතුරු මාතලේ ගම්බද උසාවි සභාපති වශයෙන් හා නැගෙනහිර මාතලේ අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/ටී.1/48.

එම්. එහෙම්පර නාදන් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු පී. කුමාරනායගම් මහතා 1962 ඔක්තෝබර් මස 1 වැනි, 2 වැනි, 4 වැනි, 5 වැනි, 8 වැනි, 9 වැනි, 11 වැනි, 12 වැනි, 15 වැනි, 16 වැනි, 18 වැනි, 19 වැනි, 22 වැනි දින සිට 24 වැනි දින දක්වා, 25 වැනි, 26 වැනි සහ 29 වැනි දින සිට 31 වැනි දින දක්වා ත්‍රිකුණාමලේ දිස්ත්‍රික්කයේ කඩුකුලාම් සහ තම්පලාකාමම් පත්තුවල ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/ටී.4/59.

සී. බී. ඇල්ලේපොල මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු ජේ. ඒ. හසන්නලි මහතා 1962 සැප්තැම්බර් මස 24 වැනි, 25 වැනි සහ 27 වැනි දිනයන්හි බදුල්ල දිස්ත්‍රික්කයේ වෙල්ලස්ස-බින්තැන්න සහ බුත්තල ගම්බද උසාවි සභාපති වශයෙන් සහ යටිකිඳ අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/ඩබ්ලිව්. 10/53.

ඊ. බී. වැත්තෑව මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු එම්. ඒ. ටී. බී. පෙරේරා මහතා 1962 සැප්තැම්බර් මස 25 වැනි දින කුරුණෑගල දිස්ත්‍රික්කයේ දේවමැදි හත්පත්තුවේ ගම්බද උසාවි සභාපති වශයෙන් සහ වන්නි හත්පත්තුවේ, කටුගම්පොල සහ හිරියාල හත්පත්තුවේ අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/ඩබ්ලිව්. 9/53.

පී. සී. පී. විජේසේකර මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු ජේ. එස්. පෙරේරා මහතා 1962 ඔක්තෝබර් මස 1 වෙනි දින කළුතර දිස්ත්‍රික්කයේ නැගෙනහිර පස්දුන් කෝරළේ සහ බටහිර පස්දුන් කෝරළේ සහ කළුතර තොටමුනේ ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

ඇන්. ඒ. ද ඇස්. විජේසේකර,
අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1962 ඔක්තෝබර් මස 5 වෙනි දින,
අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලය,
තැ. පෙ. අංකය—573,
කොළඹ—12.

10-378

## වෙනත් පත් කිරීම් ආදිය

1962 අංක 422

අංකය : ඒ ඕ. 1958.

අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ ගරු අධිකරණ අමාත්‍යවරයා කෙරෙහි පවරා ඇති බලතල අනුව එතුමා විසින්—

1. ඩී. ඩබ්ලිව්. ජී. රණසිංහ මහතා කොළඹ නගර සභාවේ ප්‍රධාන නක්සේරුකරු ධුරය දරණ කාලයතුල කොළඹ අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවකු වශයෙන් පත්කර ඇත්තේ ය.

1947 සැප්තැම්බර් මස 18 වෙනි දින අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේගේ ප්‍රකාශනයකින් සංශෝධිත සිවිල් නඩු විධාන සංග්‍රහයේ 372 වෙනි වගන්තිය යටතේ ගරු අධිකරණ අමාත්‍ය වරයා විසින් සිවිල් නඩු විධාන සංග්‍රහයේ 371 වෙනි වගන්තියේ සඳහන් දිව්රුම් පත්‍ර පිළිගෙල කිරීමට අවශ්‍ය වන සහතික කිරීම් හෝ දිවිරීම් හෝ කරවීමට විශේෂයෙන් බලය පවරා ඇති නිලධාරීන් වශයෙන් කේ. පත්මනාදන්, එස්. එම්. ජයසිංහ සහ කේ. නඩේසන් යන මහත්වරු යාපනේ පිස්කල් තැනගේ

කාර්‍යාලයේ ලිපිකරු ධුර දරණ කාලයතුල පේදුරුතුඩුව, චාවකච්චේරි, මල්ලකම් හා කයිට්ස් යන අධිකරණ කොට්ඨාශ සඳහා පත් කර ඇත්තේ ය.

ඩී. ජේ. ආර්. ගුණවර්ධන,
අධිකරණ අමාත්‍යාංශයේ
වැඩබලන ස්ථිර ලේකම්.

1962 ඔක්තෝබර් මස 5 වෙනි දින,
කොළඹ අධිකරණ අමාත්‍යාංශයේ දීය.

10-485

---

1962 අංක 423

ලංකා සිවිල් සේවාවේ පහත සඳහන් පත්වීම් පහත දක්වා ඇති දිනවල පටන් වලංගුවේ :—

අංකය : 74/2/23 (ඇම් ඇෆ්ජ්).

සී. ආර් ද සිල්වා මහතා 1962 ජූලි මස 2 වෙනි දින සිට සමුපකාර සංවර්ධන සහ සමුපකාර සමිති ලියාපදිංචි කිරීමේ රෙජිස්ත්‍රාර් වරයාගේ දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය කොමසාරිස් (පාලක) වශයෙන් වැඩ බැලීමට.

අංකය : 74/2/91 (ඇම්. ඇෆ්ජ්).

කේ. කේ. සෝමපාල මහතා 1962 සැප්තැම්බර් මස 17 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පාලන සහකාර වශයෙන් වැඩ බැලීමට.

අංකය : 74/29 (ඇම් ඇෆ්ජ්).

ඇම්. බී. සී. ප්‍රනාන්දු මහතා, 1962 සැප්තැම්බර් මස 8 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු අධ්‍යාපන අමාත්‍යාංශයේ පාලන සහකාර වශයෙන් වැඩ බැලීමට.

හෙ. ජිනදාස,
වැඩ බලන භාණ්ඩාගාරයේ ලේකම්.

1962 ඔක්තෝබර් 5 වැනිදා.
මුදල් අමාත්‍යාංශය,
කොළඹ.

10-408

---

1962 අංක 424

ලංකා සිවිල් සේවාවේ පහත සඳහන් පත්වීම් පහත දක්වා ඇති දිනවල පටන් වලංගුවේ :—

අංක 74/2/37 (ඇම් ඇෆ්ජ්).

ඇල්. ඇල්. ටී. පීරිස් මහතා 1962 සැප්තැම්බර් මස 17 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු මහා භාණ්ඩාගාරයේ සහකාර ආයතන පාලකයකු වශයෙන් වැඩ බැලීමට.

ඇස්. කනගරායර මහතා 1962 සැප්තැම්බර් මස 17 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු මහා භාණ්ඩාගාරයේ සහකාර ආයතන පාලකයෙකු වශයෙන් වැඩ බැලීමට.

අංක 74/2/71 (ඇම් ඇෆ්ජ්).

බී. සී. පෙරේරා මහතා 1962 සැප්තැම්බර් මස 17 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සහකාර ලේකම් වශයෙන් වැඩ බැලීමට.

අංක 74/2/210 (ඇම් ඇෆ්ජ්).

ඇස්. වික්‍රමසිංහ මහතා 1962 සැප්තැම්බර් මස 17 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු කර්මාන්ත ස්වදේශ හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයට අනුයුක්තව සිටීමට.

අංක 74/29 (ඇම්. ඇෆ්ජ්).

කේ. එච්. ජේ. විජයදාස මහතා 1962 අගෝස්තු මස 4 වැනි දින සිට අධ්‍යාපන අමාත්‍යාංශයේ සහකාර ලේකම් වශයෙන් වැඩ බැලීමට.

ආර්. ජී. ජී. ඕ. ගුණසේකර මහතා 1962 අගෝස්තු මස 4 වැනි දින සිට අධ්‍යාපන අමාත්‍යාංශයේ සහකාර ලේකම් වශයෙන් වැඩ බැලීමට.

ජේ. ඒ. වික්‍රමනායක මහතා 1962 සැප්තැම්බර් මස 8 වැනි දින සිට අධ්‍යාපන අමාත්‍යාංශයේ සහකාර ලේකම් වශයෙන් වැඩ බැලීමට.

අංක 74/76 (ඇම් ඇෆ්ජ්).

එස්. සිවනාදන් මහතා 1962 සැප්තැම්බර් මස 17 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ පාලන නිලධාරියකු වශයෙන් වැඩ බැලීමට.

හෙ. ජිනදාස,
වැඩබලන භාණ්ඩාගාරයේ ලේකම්.

1962 ඔක්තෝබර් 3 වැනි දින.
මුදල් අමාත්‍යාංශය,
කොළඹ.

10-275

---

1962 අංක 425

## දැන්වීමයි

තිස්ස වික්‍රමාරච්චි කරුණාරත්න මහතා ගම්පහ අධිකරණ කොට්ඨාශය ඇතුලත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් කර්මාන්ත, ස්වදේශ සහ සංස්කෘතික කටයුතු පිළිබඳ ගරු අමාත්‍යතුමා විසින් පත් කර තිබේ.

වී. ඇල්. වීරසිංහ,
කර්මාන්ත, ස්වදේශ සහ සංස්කෘතික කටයුතු පිළිබඳ
අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1962 සැප්තැම්බර් මස 27 වැනි දින.
කොළඹ දී ය.

10-244

---

# ආණ්ඩුවේ නිවේදන

අ. ආ. කා. අංකය : ඇල්. 91.
කෘ. ඉ. වා. හා වි/අමා. අංකය : ජේ. 258 (බී. ආර්.)

1950 ගේ අංක 9 දරන ඉඩම් පවරා ගැනීමේ පනතේ (460 වැනි අධිකාරයේ) 19 (1) වැනි වගන්තියේ විධිවිධාන යටතේ, කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලි බලය පිළිබඳ ගරු ඇමතිතුමන්ගේ උපදෙස් පිට, අග්‍රාණ්ඩුකාරතුමන් විසින් ඇෆ්ජ්. කැරගල මහතා, 1962 ඔක්තෝබර් 1 වැනි දින සිට, අවුරුදු 3 ක කාලයක් සඳහා, එහි සඳහන් වන පරිදි ඇපැල් නඩු විසඳීම පිණිස වූ විවේචන මණ්ඩලයේ තක්සේරු සාමාජිකයෙකු වශයෙන් පත් කළ බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

සී. ජ. වල්පිට,
අග්‍රාණ්ඩුකාරතුමාගේ ලේකම්.

1962 ඔක්තෝබර් 1 වැනි දින,
කොළඹ, අග්‍රාණ්ඩුකාරතුමාගේ කාර්යාලයේ දී.

10-246

---

ඇල්.ඕ.—බී. 32/61.

## 1961 අංක 70 දරණ අනිවාර්ය රාජ්‍ය සේවා පනත

1961 අංක 70 දරණ අනිවාර්ය රාජ්‍ය සේවා පනතේ 3 සහ 7 යන වගන්තිවලින් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මුදල් ඇමතිවරයා විසින් පනවනු ලබන ආඥාව.

සී. පී ද සිල්වා,
මුදල් ඇමතිවරයා.

1962 ඔක්තෝබර් 4,
කොළඹ දීය.

ආඥාව

1961කේ අංක 70 දරණ අනිවාර්ය රාජ්‍ය සේවා පනතෙහි 3 (2) වෙනි වගන්තියේ කාර්‍ය සඳහා ලංකා විශ්ව විද්‍යාලයේ හෝ ලංකාවෙහි පිහිටුවන ලද ආණ්ඩුවෙන් ආධාර මුදලක් ලබන අන් කිසි විශ්ව විද්‍යාලයක ඉංජිනේරු උපාධිධරයෙකු බවට පත්වන තැනැත්තකු සම්බන්ධයෙන් නියමිත කාල සීමාව තෙමසක් විය යුතුයි.

10-319

## පඩිපාලක සභා ආඥා පනත

### නිවේදනයයි

ගඩොල් හා උළු සෑදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාවේ සාමාජිකයන් හැටියට 1962 අගෝස්තු මස 10 වැනි දින සිට අවුරුදු තුනක කාලයක් තුළ පෙනී සිටීමට (136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ 9 වන වගන්තිය යටතේ කම්කරු හා ජනසතු සේවා ගරු ඇමතිතුමන් විසින් පහත නම් සඳහන් තැනැත්තන් පත් කරන ලද බව 1943 පඩිපාලක සභා පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ 26 වන ව්‍යවස්ථාව යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

වී. ඇස්. ඇම්. ද මෙල්,
කම්කරු හා ජනසතු සේවා අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්වරයා.

1962 ඔක්තෝබර් මස 3 වන දින,
කොළඹ දීය.

**නම නියමකොට පත්කරනු ලබන සාමාජිකයෝ—**

1. ඇල්. එච්. සුමනදාස මහතා.
2. ජී. ඩබ්ලිව්. ඉදිරිවීර මහතා.
3. සී. සූරියකුමාරන් මහතා.

**සේව්‍ය නියෝජිතවරු—**

1. ඇම්. එච්. ආර්. ඇස්ටබරි මහතා.
2. එච්. ඩබ්ලිව්. හික්මන් පීටර් මහතා.
3. ඩී. ඩබ්ලිව්. පොතිම්පියගේ මහතා.
4. ඇස්. සුබසිංහ මහතා.
5. කේ. ඩී. ඇන්. ආරියරත්න මහතා.
6. ඩී. ඩී. මිගෙල් නෝරිස් අප්පුහාමි මහතා.
7. ඇස්. ඒ. ඩබ්ලිව්. සුබසිංහ මහතා.
8. ගිරිගෝරිස් පීරිස් මහතා.

**සේවක නියෝජිතවරු—**

1. ඇම්. ඇස්. බක්මීවැව මහතා.
2. ඩබ්ලිව්. කරෝලිස් පෙරේරා මහතා.
3. වයි. කේ. ගුණදාස මහතා.
4. ජී. පී. පෙරේරා මහතා.
5. ඇම්. පියසේන පෙරේරා මහතා.
6. ඇන්. ෂන්මුගදසන් මහතා.
7. ඒ. ඩබ්ලිව්. පෙරේරා මහතා.
8. ඩබ්ලිව්. මොසිසෙස් ප්‍රනාන්දු මහතා.

10-398

---

## (219 වෙනි අධිකාරය වන) සෞඛ්‍ය සේවා පණත

### රත්නපුර ආරෝග්‍යශාලා මණ්ඩලය

(219 වෙනි අධිකාරය වන) සෞඛ්‍ය සේවා පණතේ 11 වෙනි වගන්තිය යටතේ 1962 සැප්තැම්බර් මස 30 වෙනි දින පටන් 1962 දෙසැම්බර් මස 31 වෙනි දින දක්වා පහත සඳහන් අය රත්නපුර ආරෝග්‍යශාලා මණ්ඩලයේ සාමාජිකයින් වශයෙන් ගරු සෞඛ්‍ය ඇමතිතුමා විසින් පත් කරනු ලැබූහ.

එල්. එස්. බී. පෙරේරා,
ස්ථිර ලේකම්.

1962 සැප්තැම්බර් මස 30 වෙනි දින,
කොළඹ සෞඛ්‍ය අමාත්‍යාංශයේ දීය.

### නාමලේඛනය

ඊ. එච්. ගුණසේකර මුදලිතුමා.
ආචාර්ය ඒ. ඩබ්ලිව්. ආර්. ජෝකිම්.
ඉන්ද්‍රානී එල්ලාවල මහත්මිය.

10-243

---

## 1961 අංක 62 දරණ වෙළඳුන් හට බලපත්‍ර නිකුත් කිරීමේ පනත

### 4 (7) දරණ වගන්තිය යටතේ නිවේදනය

1961 අංක 62 දරණ වෙළඳුන් හට බලපත්‍ර නිකුත් කිරීමේ පනත යටතේ වාණිජ, වෙළඳ, ආහාර හා නැව් කටයුතු පිළිබඳ ඇමතිතුමා සැනවූ පහත සඳහන් නියෝගය සෙනෙට් මන්ත්‍රී මණ්ඩලය සහ නියෝජිත මන්ත්‍රී මණ්ඩලය අනුමතකර තිබෙන බව මෙයින් නිවේදනය කෙරේ :—

වෙළඳුන් හට බලපත්‍ර නිකුත් කිරීමේ 1961 (අංක 1) නියෝග සංශෝධනය කරමින්, 1962 මැයි 23 වැනි දින අංක 13,132 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කළ නියෝගය.

එච්. ඊ. තෙන්නකෝන්,
අතිරේක ස්ථිර ලේකම්,
වාණිජ, වෙළඳ, ආහාර හා නැව් කටයුතු
පිළිබඳ අමාත්‍යාංශය.

1962 ඔක්තෝබර් 5 වෙනි දින,
කොළඹ දීය.

10-425

---

## 1954 අංක 37 දරණ ජාතික නිවාස පනත

### 49 ඡේදය යටතේ සහතිකය

පළාත් පාලන හා නිවාස පිළිබඳ ඇමතිවර, මහානාම සමරවීර වන මම, 1954 අංක 37 දරණ ජාතික නිවාස පනතේ 49 වන ඡේදය යටතේ මා වෙත පවරා ඇති බලතල උඩ මෙහි පහත සඳහන් උපලේඛනයෙහි විස්තර කර ඇති ඉඩම එම පනතෙහි 2 වන ඡේදයෙහි අදහසට ඇතුළත් නිවාස අරමුණක් ක්‍රියාත්මක කිරීම සඳහා රජය මගින් අත්කර ගතයුතු බව මෙයින් සහතික කරමි.

මහානාම සමරවීර,
පළාත් පාලන හා නිවාස ඇමතිතුමා.

1962 සැප්තැම්බර් 15 වැනි දින දීය.
කොළඹ 2.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ දකුණු අළුත් කුරු කෝරලය ආදායම් නිලධාරී කොට්ඨාශයේ, අංක 216 දරණ හොරගොල්ල ගම්මුලාදෑනි වසමේ පිහිටි කුරුඳුගහලන්ද නමැති ඉඩමෙන් පහත සඳහන් පරිදි මායිම් ඇති අක්කර 5ක පමණ ප්‍රමාණයක ඉඩම් කොටසක් :—

උතුරට : එම ඉඩමේ ඉතිරි කොටස ; නැගෙනහිරට : කිරිදිවත්තගනේමුල්ල ප්‍රසිද්ධ පාර ; දකුණට : මරියා සිල්වා මමී. ට අයිති ඉඩම් ; බස්නාහිරට : ටී. ඩී. ඒ. පෙරේරා මහතාට අයිති ඉඩම්.

10—298

---

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## 1963 වසර සඳහා බදුල්ල දිසාවේ තුවක්කු බලපත් අළුත්වැඩියා කිරීම

1963 වසර සඳහා බදුල්ල දිසාවේ තුවක්කු බලපත් අළුත්වැඩියා කිරීම 1962 ඔක්තෝබර් මස 15 වැනි දින සිට ඒ ඒ පෙදෙස් භාර ආදායම් නිලධාරීන් විසින් කැරෙණ බව මහජනයා වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

2. 1963 වසර වෙනුවෙන් බලපත් නිකුත් කිරීමට පෙර 1962 දෙසැම්බර මස 31 වැනි දින හෝ ඊට පෙර පරණ බලපත් අළුත්වැඩියා කර එම බලපත් වෙනුවෙන් වූ තුවක්කුත් ආදායම් නිලධාරීන්ගේ පිරික්සුම පිණිස ඉදිරිපත් කළ යුතු බව තුවක්කු හිමියන් වෙත නිවේදනය කරමි.

3. තවදුරටත් 1962 දෙසැම්බර මස 31 වැනි දිනට පසුව ලැබෙන ඉල්ලුම් වෙනුවෙන් බලපත් ගාස්තුවත් ඊට අමතරව දඩයෙකුත් ගෙවීමට සිදුවන බව සළකන්න. 1962 දෙසැම්බර මස 31 වැනි දින හෝ ඊට පළමු පාවිච්චි කිරීමට නුසුදුසු හා පාවිච්චි කිරීමට බලාපොරොත්තු නොවන සියළුම තුවක්කු හා බලපත් ඒ ඒ පෙදෙස් භාර ආදායම් නිලධාරීන්ට භාර දිය යුතු බවත් දන්වමි.

4. 1963 වසර වෙනුවෙන් බලපත් අළුත්වැඩියා නොකර සිටින අය සඳහා 1963 මාර්තු මස 31 වැනි දින සිට නඩු පැවරීමට කටයුතු සලස්වන බව දත යුතුයි.

ඇන්. විජේවර්ධන,
බදුල්ල දිසාවේ දිසාපති හා බලපත් නිකුත් කිරීමේ
නිලධාරි තැන

1962 ඔක්තෝබර මස 4 දින,
බදුල්ලේ දිසාපති කාර්යාලයේ දී.

10-314

## දැන්වීමයි

**කො/සිරිසඟබෝ පිරිවෙන, බෝපැත්ත, අත්තනගල්ල**

කොළඹ දිස්ත්‍රික්කයේ නැගෙනහිර සියනෑකෝරළේ, උඩුගහ පත්තුවේ අත්තනගල්ලේ, බෝපැත්තේ පිහිටි සිරිසඟබෝ පිරිවෙන ආධාර ලබන පිරිවෙනක් ලෙස තාවකාලික වශයෙන් 14. 9. 60 දින සිට ලියාපදිංචි කළ බව මෙයින් දන්වමි.

ඇස්. ඇෆ්. ද සිල්වා,
අධ්‍යාපනාධ්‍යක්‍ෂ.

ඊ.ඇස්.බී. 59,
1962 ඔක්තෝබර් මස 3 වැනි දින,
කොළඹ 2 මලයි වීදියේ,
අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ දීය.

10—274

## දැන්වීමයි

**කළු/අභයරාජ පිරිවෙන, නාරවිල**

බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ බටහිර පස්යොදුන් කෝරළේ ඉද්දගොඩ පත්තුවේ නාරවිල පිහිටි ඉහත සඳහන් පිරිවෙන ආධාර ලබන පිරිවෙනක් ලෙස තාවකාලික වශයෙන් ලියාපදිංචි කළ බව මෙයින් දන්වමි.

ඇස්. ඇෆ්. ද සිල්වා,
අධ්‍යාපනාධ්‍යක්‍ෂ.

ඊ.එස්.බී. 28.
1962 සැප්තැම්බර් මස 29 වෙනි දින,
කොළඹ මැලේ වීදියේ,
අධ්‍යාපන දෙපාර්තමේන්තුවේදී ය.

10—293

සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම පස්වරු 3.30 ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3.30 ට ප්‍රථමයෙන්).

ගැසට් පත්‍රය ලබාගැනීම සඳහා දායකමුදල් කොළඹ, මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුය. ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දායක මුදල් භාරගනු නොලැබේ.

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි
නිපදවන ලද කඩදාසිවල ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි